www.wsws.org
ලෝක සමාජවාදී වෙබ් අඩවිය
හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# බෙයිජිං ඔලිම්පික් උලෙල ධනවාදී වෙළඳ පොල හා ජාතිකවාදය සමරයි

## Beijing Olympics celebrate the capitalist market and nationalism

**ජෝන් චැන් විසිනි**
**2008 අගෝස්තු 8**

අද රාත්‍රියේ පැවැත්වෙන බෙයිජිං ඔලිම්පික් ක්‍රීඩා සමාරම්භක උත්සවය චීන කොමියුනිස්ට් පක්ෂ (සීසීපී) තන්ත්‍රය විසින් පසුගිය සත් වසරක කාලය මුලුල්ලේ ප්‍රවේශමෙන් සූදානම් කරනු ලැබ ඇත්තේ, නව ආර්ථික බලයක් ලෙස චීනයේ නැගීම ප්‍රදර්ශනය කරනු පිනිස ය. මෙම උලෙල ද පෙර පැවති ඔලිම්පික් උත්සව මෙන් ම, එහෙත් වඩා දැවැන්ත පරිමානයකින්, අත දිග හැර වියදම් කල එ.ජ. ඩොලර් බිලියන 43ක සුවිශාල සාදයකි. මෙවර එය චීනයේ නව ධනපති ප්‍රභූවට නම්, ලෝක වේදිකාව මත තමන්ගේ ප්‍රවේශය සැමරීමකි.

උත්සවයේ සමාරම්භය හැකි තරම් "8" ඉලක්කම් ඇතුලු වන පරිදි සැලසුම් කෙරී ඇත්තේ -- 2008 අගෝස්තු 8 වන දා පස්වරු 8.08ට -- චීන ධනවාදයේ සටන් පාඨය ලැජ්ජා විරහිත ලෙස පිලිබිඹු කරමිනි: එනම්, "ධනවත් වන්න, ධනවත් වන්න, තවත් ධනවත් වන්න" යන්න යි. 1978 දී ඩෙන් ෂියාඕපිං වෙළඳ පොල ප්‍රතිසංස්කරන ආරම්භ කිරීමෙන් මද කලක් ගතවීමට පෙර ම, (චීන භාෂාවෙන් "බා" යනුවෙන් උච්චාරනය කෙරෙන) "8" ඉලක්කම ධනවත් වීම සඳහා වන වාසනාවන්ත ඉලක්කම බවට පත් වූයේ, සෞභාග්‍යය සඳහා යෙදෙන චීන වචනයට ("ෆා") සමාන ආකාරයකින් එය උච්චාරනය කෙරෙන බැවිනි. එහි අරමුන වන්නේ දේශීය ධනපති ප්‍රභූවට පමනක් නොව, ගෝලීය සංගත නායකයන්ට ද පැහැදිලි සංඥාවක් ලබා දීම යි: එනම්, ඔබට ධනවත් වෙන්න අවශ්‍ය නම්, චීනයට එන්න -- ආයෝජන හා ව්‍යාපාරික අවස්ථා සඳහා භූමිය එය යි.

කෙසේ වෙතත්, මධ්‍යස්ථ දේශගුනයකින් යුක්ත ශරත් සෘතුවේ සැප්තැම්බර් හා ඔක්තෝබර් මාස වෙනුවට ග්‍රීස්ම අගෝස්තු මාසය තෝරා ගැනීමෙන් අදහස් කෙරෙන්නේ, ගිම්හානයේ දී විශේෂයෙන් ම දරුනු වන තද දුම පාලනය කිරීමට බලධාරින්ට සිදු වන බව යි. මිලියන සංඛ්‍යාත මෝටර් රථ නතර කිරීමට ද බෙයිජිංහි කම්හල් වසා දැමීමට ද ගනු ලැබූ දරුනු පියවර තිබිය දී ම, නිල් ආකාශය දැකිය හැක්කේ යන්තම්නි. චීනයේ ජාත්‍යන්තර ප්‍රතිරූපය ප්‍රවර්ධනය කරනු වෙනුවට, මෙය සරලව ම ලෝකයේ මතකයට නංවන්නේ, ධනවාදී වෙළඳ පොලේ නිර්බාධිත ක්‍රියාකාරිත්වයට ස්තුති වන්නට චීනය ලෝකයේ අංක එකේ කාබන්ඩයොක්සයිඩ් විමෝචකයා බවට දැනට මත් පත්ව ඇත යන කරුන යි.

වසරකට ඉහත දී එක්සත් ජනපද අවමුඛ උකස් නය පද්ධතියේ බිඳ වැටීමෙන් හටගත් ගෝලීය ආර්ථික කඩා වැටීම මධ්‍යයේ, බෙයිජිං ඔලිම්පික් උත්සවය, ආර්ථික මන්දගාමීත්වයෙන්, උද්ධමනයෙන් හා වැඩෙන සමාජ අසන්තෘප්තියෙන් අවධානය තාවකාලිකව අපසරනය කරනු පිනිස ගෝලීය ධනවාදයේ නායකයන්ට අවස්ථාවක් ද සම්පාදනය කරයි. එක්සත් ජනපද ජනාධිපති ජෝර්ජ් බුෂ් හා ප්‍රන්ස ජනාධිපති නිකොලස් සාර්කොසි ඇතුලු ලෝක නායකයන් 80කට නොඅඩු සංඛ්‍යාවක් සමාරම්භක උලෙලට සහභාගි වනු ඇත.

ලෝකයේ බලවත් සංගතවල ප්‍රධාන විධායකයන් රැගෙන එන පුද්ගලික ජෙට් යානා බොහෝ සංඛ්‍යාවක් ද එම අවස්ථාවේ ම ගොඩ බසින බැවින්, මෙම ලෝක නායකයන්ගේ පැමිනීම බෙයිජිංහි ගුවන් පාලක බලධාරින්ට භයජනක අත්දැකීමක් වන බව වාර්තා වී තිබේ. ගෝලීය ප්‍රධාන විධායක නිලධාරිහු ද ඔවුන්ගේ දේශපාලන සේවකයන් මෙන් ම, චීනයේ ආර්ථික සාර්ථකත්වය බෙදා හදා ගැනීමට ආශාවෙන් සිටිති.

සත්තකින් ම, ධනවාදය තවමත් සාර්ථකව වැඩෙන එකම තැන චීනය බවක් පෙනී යයි. සුප්‍රසිද්ධ සිනමා අධ්‍යක්ෂ ෂාං යුමූ විසින් මෙහෙයවනු ලැබෙන දැවැන්ත ගිනි කෙලි සංදර්ශනයේ හා විචිත්‍ර සමාරම්භක උලෙලේ එල්ලය වන්නේ, හුදෙක් චීනයේ සම්ප්‍රදායික සංස්කෘතිය පමනක් නොව, රටේ වැඩෙන ආර්ථික බලපරාක්‍රමය ද ප්‍රදර්ශනය කිරීම යි. උත්සවයේ පෙර හුරුවක් කාන්දු කල දකුනු කොරියානු රූපවාහිනියේ ප්‍රදර්ශනය කල පරිදි, චීනයේ ශීඝ්‍ර ප්‍රසාරනය පෙන්නුම් කරමින්, සුන්බුන් අතරින් ගොඩනැගිලි විශාල සංඛ්‍යාවක් හිටි අඩියේ ඉස්මතු වන අයුරු එක් දර්ශනයකින් දැක්වුනි. 1978 සිට 2007 දක්වා, චීනය 40 ගුනයකින් වර්ධනය වී ඇත්තේ, අතිශයින් ම දුප්පත් රටක් ලෝකයේ සිවුවන විශාලතම ආර්ථිකය බවට පත් කරමිනි.

ප්‍රමුඛ පෙලේ ජාත්‍යන්තර ගෘහ නිර්මාන ශිල්පීන් විසින් සැලසුම් කරන ලද, ප්‍රධාන "පක්ෂි කැදැල්ල" නම් ක්‍රීඩාංගනයේ හා ඉලිප්සාකාර මහා රාජ්‍ය

නෘත්‍යාගාරයේ සිට බෙයිජිංහි සර්පිලාකාර සීසීටීවී මූලස්ථානය දක්වා අති නවීන ඔලිම්පික් ගෘහ නිර්මානවල අරමුන වන්නේ, නවීනත්වය හා ප්‍රගතිය උදෙසා වන චීනයේ ගාමකය විදේශිකයන්ගේ සිත්වලට කාවැද්දීම යි. බෙයිජිං ජාත්‍යන්තර ගුවන් තොටුපලේ ප්‍රසාරනය අති දැවැන්ත ය. එහි 3 වන පර්යන්ත ගොඩනැගිල්ල පමනක් ලන්ඩන් හීත්‍රෝ ගුවන් තොටුපලේ පර්යන්ත ගොඩනැගිලි පහේ මුලු විශාලත්වයට වඩා දැවැන්ත ය.

බහු ජාතික සංගත දොලසක්, ඔලිම්පික් උලෙලේ අවස්ථා නරඹනු ඇතැයි බලාපොරොත්තු වන ලොව වටා සිටින බිලියන 4ක් පමන වන ජනයා ඉදිරියේ සිය නිෂ්පාදිතවලට ප්‍රචාරකයක් ලබා ගනු පිනිස, ඔලිම්පික් ගෝලීය අනුග්‍රාහකයන් බවට පත් වනු වස්, එකිනෙකා ඩොලර් මිලියන 200 දක්වා වන ප්‍රමානයන්ගෙන් මුදල් ගෙවා තිබේ. මුලුමනින් ම ගත් කල, අනුග්‍රාහකත්වය ඩොලර් මිලියන 866ක් වේ. එය වනාහි 2004 ඇතැන්ස් ඔලිම්පික් උලෙලේ ප්‍රමානයට වඩා තුනෙන් එකකින් වැඩි අගයකි. බිලියන 1.5ක් ලෙස තක්සේරු කෙරී ඇති, ගෝලීය අනුග්‍රාහකයන්ගෙන් ලැබෙන ප්‍රචාරක ආදායම නැත හොත් සෙසු බහු ජාතික හා චීන සංගත දූසිම් ගනනක් විසින් හවුල්කාරකම් වෙනුවෙන් ගෙවනු ලබන වියදම මෙයට ඇතුලත් නොවේ. ඇඩිඩාස් සංගතය පමනක්, චීනය තුල අලෙවි කෙරෙන සිය නිෂ්පාදිත වෙනුවෙන් ඔලිම්පික් සංකේතය යොදා ගැනීම සඳහා ඩොලර් මිලියන 80ක් ගෙවා ඇතැයි වාර්තා වේ.

"එකම ලෝකයක්, එකම සිහිනයක්" යන්න බෙයිජිං ඔලිම්පික් උලෙලේ සටන් පාඨය යි. එහෙත් චීනයේ නැගීම සම්බන්ධයෙන් වොෂිංටනයේ, ටෝකියෝවේ සහ යුරෝපයේ පාලන තන්ත්‍රයන් දරන හැඟීම් වඩා සංකීර්න ස්වරූපයක් ගනී. එක අතකින්, ලොව වටා මහා සංගත දැන් යැපෙන්නේ, ලෝකයේ විශාලතම කම්කරු පන්තිය වන චීන කම්කරු පන්තිය අධි-සූරාකෑමකට ලක් කිරීම මත ය. අනෙක් අතට, අමු ද්‍රව්‍ය, වෙලඳ පොලවල් හා භූ-දේශපාලනික ආනුභාවය උදෙසා වන අරගලයේ දී ස්ථාපිත බලවතුන්ට එරෙහි ප්‍රතිවාදියකු ලෙස චීනයේ ශීඝ්‍ර නැගීම සම්බන්ධයෙන් පවතින්නේ නොඉවසුම් සහගත බවකි.

ඔලිම්පික් උලෙල දේශපාලනික නොකරන ලෙස චීන ජනාධිපති හූ ජින්ටාඕ කල ආයාචනය තිබිය දී ම, සමහර බටහිර නායකයන්, බෙයිජිංහි මානව හිමිකම් වාර්තාව හෝ ටිබෙට්හි එය පවත්වා ගෙන යන මර්දනකාරී පාලනය පිලිබඳ ගැටලු මතු කර තිබේ. පසුගිය සතියේ ජනාධිපති බුෂ් ධවල මන්දිරයේ දී චීන "ප්‍රජාතන්ත්‍රී ව්‍යාපාරයේ පිටුවාහල් නායකයන් පිලිගත්තේ ය. ඉන් අනතුරුව එක්සත් ජනපදයේ නියෝජිත මන්ත්‍රී මන්ඩලය මුලුමනින් ම පාහේ ඒකච්ඡන්දයෙන් සම්මත කල යෝජනාවකින් ඉල්ලා සිටියේ චීනය සිය මානය හිමිකම් වාර්තාව වැඩි දියුනු කරගත යුතු බවකි.

ඔලිම්පික් උලෙල සඳහා පිටත්වීමට පෙරාතුව, ඉරාක යුද්ධය එක්සත් ජනපදයේ වියදමින් සිය ආනුභාවය වර්ධනය කරගනු වස් චීනයට ඉඩ සලසා ඇති බවට එල්ල වූ විවේචන මධ්‍යයේ, බුෂ් වොෂිංටනයේ සිටින ආසියානු වාර්තාකරුවන්ට කියා සිටියේ, එක්සත් ජනපදය ආසියාවේ සිය සගයන් වෙනුවෙන් කැප වී සිටින බව යි. බෙයිජිං තන්ත්‍රයට උවමනාවට වඩා සමීප නොවන ලෙස ආසියානු රටවලට අනතුරු අඟවමින්, බුෂ් මෙසේ ප්‍රකාශ කලේ ය: "බොහෝ අවස්ථාවන්හි දී, ඔබ එක් අයකු සමග මිත්‍ර වුව හොත්, වෙනත් අයකු සමග මිත්‍ර වීම ඔබට අසිරු වේවි." බෙයිජිංවලට ලඟා වීමට පෙර බැංකොක් නගරයේ නතර වූ බුෂ්, බෙයිජිං තන්ත්‍රය චීන පුරවැසියන්ට" නිදහස " ලබා දිය යුතු යැයි ඉල්ලා සිටිමින් කතාවක් පැවැත්වී ය.

චීන ආන්ඩුවේ ප්‍රකාශක ලියු ජියාන්චාඕ, එක්සත් ජනපද කොංග්‍රස් මන්ඩලයේ යෝජනාව ඔලිම්පික් උලෙල "කඩාකප්පල්" කිරීමේ උත්සාහයක් ලෙස හංවඩු ගැසූ අතර, බුෂ් "චීනයේ අභ්‍යන්තර කටයුතුවලට කෲර ලෙස ඇඟිලි ගසමින් චීන විරෝධී සතුරු බලවේගවලට බරපතල ලෙස වැරදි සංඥාවක් යවා" ඇතැයි ද පැවසී ය. විශාල වසයෙන් දේශීය පරිභෝජනය සඳහා වන මෙම ජාතිකවාදී පූච්චානම්වලට පිටුපසින්, බෙයිජිං පාලනය හොඳින් දන්නා කාරනාව නම්, ක්‍රීඩා උත්සවය වර්ජනය කරන ලෙස කෙරුනු ඉල්ලීම්වලට බුෂ් ප්‍රතිරෝධය දැක්වූ බව යි.

තථ්‍ය වසයෙන් ගත් කල, එතෙර පැවැති ඔලිම්පික් උත්සවයකට සහභාගි වන ප්‍රථම එක්සත් ජනපද ජනාධිපති බුෂ් ය. ඊටත් වඩා නරුම වන්නේ, ටිබෙට්හි බෙයිජිං පාලනය ගෙන යන මර්දනය හේතු කොට ගෙන උත්සවය වර්ජනය කරන බවට කලින් තර්ජනය කර තිබූ, ප්‍රන්ස ජනාධිපති සාර්කොසි ය. තමා දලායි ලාමා හමු නොවනු ඇතැයි සාර්කොසි ඊලගට නිවේදනය කලේ ය. දැන් ඔහු ප්‍රකාශ කර සිටින්නේ, උත්සවය සූදානම් කිරීම වෙනුවෙන් චීන ආන්ඩුව "රන් පදක්කමක් ලැබීමට සුදුසු" බව යි. "බෙයිජිංහි මාගේ පෙනී සිටීම එය නැවත වාරයක් සහතික කරනු ඇතː එනම්, ප්‍රන්සය හා චීනය අතර මිතුරුදම ප්‍රන්සයේ විදේශ පිලිවෙතෙහි අති මූලික අක්ෂයක් බව යි." යනුවෙන් ඔහු ෂින්හුවා පුවත් සේවයට පැවසී ය.

## "සුසංවේදී සමාජය"

බෙයිජිං පාලනය චීන ජාතිකවාදය ප්‍රවර්ධනය කරනු පිනිස අවස්ථාව ගසා කයි. පසුගිය 30 වසර තිස්සේ ධනපති වෙලඳ පොල විවෘතව වැලඳ ගැනීමෙන් අනතුරුව, සීසීපීය සමාජවාදය පිලිබඳව කරන කියාපෑම් විකාරයකි. තන්ත්‍රය වඩ වඩා වාරු වන්නේ, චීනයේ

වර්ධනයේ ප්‍රතිඵලයක් ලෙස වාසි ලබා ගෙන ඇති මධ්‍යම පන්තික ස්ථරවලට ආයාචනා කරමින්, චීනයේ වර්ධනය හා ගෞරවනීය තත්වය ප්‍රවර්ධනය කිරීමේ සිය වාර්තාව මත ය. පෙර පැවති ඔලිම්පික් උත්සව පහකට කෙරුනු මුලු වියදම මෙන් 1.5 ගුනයක් වන පරිදි, ඔලිම්පික් උලෙලට කෙරෙන අති මහත් වියදම, දේශීය ශ්‍රාවකත්වයකට එම කරුන අවධාරනය කිරීමට මෙන් ම, විදේශ සංගත ප්‍රභූවට චීනයෙන් ලබා ගත හැකි වාසි ප්‍රචාරනය කිරීමක් ද වේ. එමෙන් ම, චීනයේ ධනවතුන් හා දුගීන් අතර ගැඹුරු වන සමාජ අගාධය වෙතින් අවධානය වෙනතකට අපසරනය කරනු පිනිස ද ජාතිකවාදය යොදා ගැනෙයි.

චීනයේ විශ්මයජනක සමාජ අසමානතාව වසං කරගනු පිනිස, මිලියන හතරක ජනකායක්, ඔලිම්පික් උත්සවයට අවශ්‍ය පහසුකම් ඉදි කල සේවකයන් ද ඇතුලු, බොහෝ සෙයින් සොච්චම් වැටුප් ලබන සංක්‍රමනික කම්කරුවන්, නගරයෙන් පලවා හරිනු ලැබ ඇත. ආන්ඩුවේ ඉහල නිලධාරින්ට සිය දුක්ගැනවිලි ඉදිරිපත් කරනු පිනිස සටන් කිරීමට පැමිනි පෙත්සම්කරුවන් දහස් ගනනක්, පොලීසිය විසින් ඉවතට ඇද ගෙන යන ලදි. ඔවුන්ගෙන් බොහෝ දෙනෙක් රඳවා ගැනීමේ මධ්‍යස්ථානවල සිර කර තබා ඇත. දිනකට ඩොලර් 1කට වඩා අඩු අගයකට කාමර කුලියට ගත හැකි ලාභ නවාතැන් පොලවල හා ගොඩනැගිලිවල යටමාලයේ නිවාසවල වාසය කිරීමට නාගරික දුගීන් පුරුදු වූ සිටි නමුත් එම ස්ථාන වසා දමා තිබේ.

සිය පියා වෙනුවෙන් විශ්‍රාම වැටුපක් ඉල්ලා සිටි පෙත්සම්කරුවකු වූ වැං ලිජුන් *ලොස් ඇන්ජලීස් ටයිම්ස්* පත්‍රයට මෙසේ පැවසී යඃ "ඔවුන් කියනවා අපි නිෂේධනීටය ප්‍රතිරූපයක් නිර්මානය කරනවා කියලා. ඔවුන් අපට සලකන්නෙ සරනගතයන් හා අපරාධකාරයන් ලෙස යි." වානේ කම්හලකින් දොට්ට දමන ලද සිය සැමියා වෙනුවෙන් වසර හතක් තිස්සේ පෙත්සම් ඉදිරිපත් කරමින් සිටින, තවත් කාන්තාවක වන, ෂැන්සි පලාතේ ලි ලි මෙසේ පැහැදිලි කලා යඃ "ඔවුන් මීට පෙර කවර දාකටත් වඩා අපව මර්දනයට ලක් කරනවා. ඔවුන් අපට සලකන්නෙ රටේ ස්ථාවරත්වය කඩාකප්පල් කරන සතුරන් ලෙසයි." ඉන් පසුව ඇය මෙසේ ද පැවසුවා යඃ "ඔවුන් අපෙන් ඉල්ලා සිටිනවා, ඔලිම්පික් ක්‍රීඩා උත්සවය වැලඳගන්න, රටට ආදරය කරන්න, පක්ෂයට ආදරය කරන්න කියලා. ඒත් ඔවුන් අපට ආදරේ නැහැ."

ත්‍රස්තවාදය වැලැක්වීමේ නාමයෙන්, ලෝක නායකයන් හා ඔලිම්පික් උලෙලට අදාල ස්ථාන ආරක්ෂා කරනු පිනිස පොලිස්-රාජ්‍ය යන්ත්‍රනය මුලුමනින් ම බලමුලු ගන්වා ඇත. පැරා-මිලිටරි පොලීසියෙන්, හමුදා භටයන්ගෙන් හා විශේෂ බලකායේ කොටස්වලින් සමන්විත 100,000ක ත්‍රස්ත විරෝධී හමුදාවක් ද ඊට අමතරව ලක්ෂ ගනනාවක සාමාන්‍ය පොලිස් නිලධාරින්, ආරක්ෂක භටයන් හා ස්වේච්ඡා මුර සේවා භටයන් ද සේවයේ යොදවා ඇත.

දැන් බෙයිජිං නගරයෙන් පිටත රඳවා ඇති හය වන සන්නද්ධ රථ බලකාය ඇතුලු මහජන විමුක්ති හමුදාවේ (පීඑල්ඒ) භටයන් 34,000ක් ද යොදවා ඇති ආරක්ෂක හමුදාවන්ට ඇතුලත් ය. මැනවින් සන්නද්ධ සිය බලකායේ කොටස් "හදිසි අවස්ථාවක" දී වහාම අගනුවරට ගෙන එනු ඇතැයි එම බලකායේ අන දෙන නිලධාරියා ජන මාධ්‍යවලට පැවසී ය. එම යුද ටැංකි අවසාන වතාවට බෙයිජිංහි වීදි දිගේ ගමන් කලේ, තියන්ආන්මෙන් චතුරස්‍රයේ විරෝධය දැක්වූ කම්කරුවන් හා ශිෂ්‍යයන් තලා දමනු පිනිස 1989 දී ය.

මිලිටරිය ප්‍රහාරක් ජෙට් යානා 74ක්, හෙලිකොප්ටර් 48ක් හා නාවික හමුදාවේ නැව් 33ක් මෙන් ම ගුවන් යානා නාශක මිසයිල හා ජෛව-රසායනික ඒකක ද යොදවා තිබේ. බෙයිජිං නගරයට ඉහල අහසේ තහනම් පියසාර කලාපයට කඩා වදින ගුවන් යානයකට මිසයිල ප්‍රහාර එල්ල කිරීම ද ඇතුලු, පුහුනු අභ්‍යාසවල යෙදෙන සටන්කරුවන් රූපවාහිනී විකාශනවලින් පෙන්වන ලදි.

ඔලිම්පික් ආරක්ෂක අන දෙන මධ්‍යස්ථානයේ සන්නද්ධ හමුදා වැඩ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ, තියාන් යික්ෂියැන්ට අනුව, ආරක්ෂක හමුදාවෝ ෂින්ජියැන් පලාතේ "නැගෙනහිර ටර්කිස්තාන්" සටන්කරුවන්, ටිබෙට් බෙදුම්වාදීන්, තහනම් කරන ලද ෆලුන් ගොං ආගමික භක්තිකයන් හා "ප්‍රජාතන්ත්‍ර" ව්‍යාපාරය ඉලක්ක කර ගනු ඇත. ඔලිම්පික් උත්සවය පැවැත්වෙන කාලය තුල දී "පරිපූර්න ආරක්ෂාව" සහතික කරනු පිනිස ටිබෙට්හි පොලිස් බලකාය දෙගුන කරනු ලැබ ඇත. "සතුරු බලවේග" සහ ත්‍රස්තවාදීන් "ජාත්‍යන්තර බලපෑමක් නිර්මානය කරනු පිනිස" සිය ආයුධ මුවහත් කරමින් හා ක්‍රියාත්මක වීමට තලියමින් සිටී." යයි *පීපල්ස් ආර්මඩ් පොලිස් නිව්ස්* ජුලි මාසයේ දී ප්‍රකාශ කලේ ය.

තන්ත්‍රයේ යුදකාමී ප්‍රකාශවලට පිටුපසින් පවතින්නේ, ව්‍යාපාර හා ආයෝජන සඳහා විශ්වාසනීය ස්ථානයක් ලෙස චීනයට පවතින ප්‍රතිරූපයට හානි විය හැකි වන පරිදි ක්‍රීඩා උත්සවයට එරෙහි යම් කඩාකප්පල් කිරීමක් සම්බන්ධයෙන් එයට පවතින අති මහත් භීතිය යි. වැඩෙන උද්ධමනය හා විරැකියාව සහ ආර්ථික මන්දගාමිත්වය පිලිබඳ සලකුනු චීනයේ දැවැන්ත සමාජ ආතතීන් උත්සන්න කර තිබේ. ෂින්ජියැන් පලාතේ මුස්ලිම් යුගුර්වරු හා ටිබෙට් ජනයා වැනි පීඩිත ජාතික සුලුතර කොටස් විරෝධතා ව්‍යාපාර පවත්වා ඇත. විරෝධතාකරුවන් සිය දුක්ගැනවිලි සම්බන්ධයෙන් අවධානය යොමු කරගනු පිනිස ලෝක මාධ්‍ය යොදා ගැනීමට උත්සාහ කරන බැවින් ඔලිම්පික් උත්සවය පැවැත්වෙන කාලය තුල දී මෙයින් ඕනෑම අසහනකාරිත්වයක් පුපුරා යා හැකි ය.

නැගෙනහිර ටර්කිස්තාන ඉස්ලාම් කන්ඩායමක්, ක්‍රීඩා උලෙලට ප්‍රහාර එල්ල කරන බවට තර්ජනය කරමින් පසුගිය මාසයේ දී හා ඊයේ වීඩියෝ පට දෙකක් නිකුත් කල අතර, චීනයේ මෑත සිදු වූ බස් බෝම්බ ප්‍රහාර මාලාවක් සම්බන්ධයෙන් ද එම කන්ඩායම වගකීම භාර ගෙන ඇත. සඳුදා, තවත් "ත්‍රස්ත" ප්‍රහාරයක් යැයි සිතිය හැකි සිද්ධියක් ඇති විය. එනම්, ෂින්ජියැන් පලාතේ කෂ්ගාර්හි පොලිස් ස්ථානයකට ග්‍රෙනේඩ් ප්‍රහාරයක් එල්ල කරනු ලැබ පොලිස් භටයන් 16ක් මරුමුවට පත් වූ බව වාර්තා විය.

සිය අශෝභන මර්දනකාරී විධික්‍රම පිලිබඳව නැගෙන විවේචන යටපත් කර ගැනීමේ ප්‍රයත්නයක් ලෙස, බෙයිජිං තන්ත්‍රය ප්‍රසිද්ධ විපරිමතධාරීන් ගනනාවක් නිදහස් කර තිබේ. බලධාරීන්, ක්‍රීඩා උත්සවය පැවැත්වෙන ස්ථානවලින් බොහෝ ඈතින් පිහිටි, "විරෝධතා කලාප" තුනක් අගනුවර පිහිටුවා ඇත. එහෙත් එම විරෝධතා දැක්වීම්වලට කල් තියා අවසර ගත යුතු ය. එසේ අවසර ගැනීමට තරම් නිර්භීත වන චීන පුරවැසියන්ට සිය අනන්‍යතාව පිලිබඳ වාර්තා තන්ත්‍රයට සැපයීමට සිදු වනු ඇත. ඔලිම්පික් අවසානයේ දී ලෝකයේ අවධානය ඉවතට යොමු වීමෙන් පසුව, ඔවුන් දරුනු දඬුවම්වලට මුහුන දීමට ඉඩ ඇත. විදේශීය විවේචකයන් ද නිශ්ශබ්ද කෙරෙනු ඇත. ටිබෙට් සම්බන්ධයෙන් හෝ චීනයේ ආගමික නිදහස නැතිකම් සම්බන්ධයෙන් හෝ විරෝධය දැක්වීමට උත්සාහ කිරීමෙන් පසුව, අඩු ගනනේ බ්‍රිතාන්‍ය හා ඇමරිකානු සංචාරකයන් හත් දෙනෙක් අත් අඩංගුවට ගෙන රඳවා ගෙන තිබේ.

බෙයිජිං ඔලිම්පික් උලෙල වෙනුවෙන් සංවිධානය කර ඇති දැවැන්ත පොලිස් හා මිලිටරි මර්දන බල ඇනිය, චීනයේ කම්කරු පන්තිය මත මෘග ධනවාදී සූරාකෑම කඩාපාත් කරන දේශපාලන තත්වයන් දෙසට යම් ආලෝකයක් විහිදුවයි. බුෂ් හා සෙසු ලෝක නායකයන් සමාරම්භක උත්සවයට සහභාගි වීම මගින් පෙන්නුම් කෙරෙන්නේ, මානව හිමිකම් හා ජාතික සුලුතර කොටස්වල ඉරනම සම්බන්ධයෙන් ඔවුන් පවත්වන කතාවල පරිපූර්න කුහක ස්වභාවය යි. බෙයිජිංහි පොලිස්-රාජ්‍ය තන්ත්‍රයෙන් තොරව, ලෝක ධනවාදී ආර්ථිකය දැන් තියෙනවාට වඩා බොහෝ සෙයින් නරක කොන්දේසිවලට මුහුන දෙන ඇත යන්න ඔවුහු හොඳින් දනිති.

© www.wsws.org